# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2360/82 – 2023 දෙසැම්බර් මස 02 වැනි සෙනසුරාදා – 2023.12.02**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2020/112.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.01.21 දිනැති හා අංක 2315/69 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.01.05 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බුත්තල, පැලවත්ත, ලංකා සීනි සමාගම, කේන්ද්‍රීය වතු අංශය හි පදිංචි එස්. ඩී. නිහාල් රාජපක්ෂ මයා සහ බුත්තල, පුද්ගලික තැපැල් මල්ල ලිපිනයෙහි පිහිටි සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/18/2023 හා 2023.11.02 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 040912 – 15 (2023/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

IR/COM/04/2020/112.
නඩු අංකය - ඒ/18/2023

එස්. ඩී. නිහාල් රාජපක්ෂ
කේන්ද්‍රීය වතු අංශය,
ලංකා සීනි සමාගම,
පැලවත්ත,
බුත්තල

*පළමු පාර්ශ්වය*

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
පුද්ගලික තැපැල් මල්ල,
බුත්තල

*දෙවන පාර්ශ්වය*

ප්‍රදානය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධනය වූ (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව, උක්ත ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2023 ජනවාරි 05 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරාවුලට හේතු වූ කරුණු වනුයේ එස්. ඩී. නිහාල් රාජපක්ෂ මහතාට එස් 1 ශ්‍රේණියට උසස්වීම් ලබානොදීමෙන් අසාධාරණයක් සිදු වී තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනය කුමක්ද? කවරදා සිට ද? යන්න පිළිබඳව වේ.

ඉහත සඳහන් කාර්මික ආරාවුල සම්බන්ධව 2023.02.06 වන දින සිට 2023.10.13 දක්වා දින 10 ක තරම් දීර්ඝ විභාගයක් පැවැත්විණි. ඒ අනුව 2023.02.06, 2023.02.23, 2023.03.31, 2023.04.26, 2023.05.22, 2023.07.10, 2023.08.03, 2023.08.24, 2023.09.26 හා 2023.10.23 දිනවල විභාග කෙරුණි. මෙම විභාග වාරවලින් විභාග වාර 3 ක කාලයක් ගත කරනු ලැබුවේ දෙපාර්ශ්වය අතර සමථයක් ඇති කරලීම වෙනුවෙනි. ඒ වෙනුවෙන් දෙවන පාර්ශ්වය නියෝජනය කරමින් පැමිණ සිටි එම සමාගමේ නීති නිලධාරි වෙත උපදෙස් ලබා දුන් නමුත් පාලන අධිකාරියේ එකඟතාවයක් ලබාගැනීමට නොහැකිවීමෙන් එම උත්සාහය අසාර්ථකවීමෙන් බේරුම්කරණය විභාගයට ගන්නා ලදි. ඒ අනුව පළමුවන පාර්ශ්වකාර නිහාල් රාජපක්ෂ මහතා ඔහු වෙනුවෙන් සාක්ෂි දුන් අතර දෙවන පාර්ශ්වය වෙනුවෙන් සහකාර පිරිස් නිලධාරි නීති හා කාර්මික සබඳතා පී. බී. ඩී. මුල්ලේගම මහතා සාක්ෂි ලබා දෙන ලදි. පළමුවන පාර්ශ්වකරු සිය සාක්ෂිවලින් දිගින් දිගටම ඒත්තු ගැන්වීමට උත්සාහ දැරුවේ 2009 න් පසුව ඔහුට උසස්වීමක් ලැබුණේ වර්ෂ 2018.08.01 වන දින බවත් ඉන් අනතුරුව තමන්ට උසස්වීමක් නොලැබුණ අතර තමන් හා සේවය කළ සමාන මට්ටමේ තනතුරු දැරූ පුද්ගලයින්ට ඔවුන්ගේ සේවා කාලය හෝ නොසළකා උසස්වීම් ලබා දුන් බවත් ය. ඒ අනුව 2009.11.01 වන දින එස් 3 ශ්‍රේණියේ සිට 2018.08.01 දින එස් 2 ශ්‍රේණියට උසස් කළ නමුත් එස් 1 ශ්‍රේණිය මේ දක්වාම ඔහුට ලබානොදුන් බව කියා සිටින අතර ඔහුගේ ප්‍රධාන ඉල්ලීම වන්නේ වසර 5 න් 5 ට උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදය අනුව 2009 න් පසුව 2014 හා 2019 වශයෙන් උසස්වීම් ලැබිය යුතු බවයි. ඔහුගේ සේවා කාලය තුළ වැටුප් රහිත නිවාඩු ලබා නොමැති අතර ආයතනයේ උන්නතිය වෙනුවෙන් කැපවීමෙන් සේවය කළ බව ද සිය සාක්ෂියෙන් කියා සිටින අතර ඔහු වෘත්තීය සමිති ක්‍රියාකාරිකයකු බැවින් එම හේතු මත උසස්වීම් ලබා නොදුන් බව තරයේ ප්‍රකාශ කර සිටී. මේ සම්බන්ධව දෙවන පාර්ශවයේ මතය වන්නේ ලංකා සීනි පුද්ගලික සමාගම 2011 වර්ෂය වන තෙක් පෞද්ගලික අංශය යටතේ පාලනය වූ බවත් 2011 සිට රජය සතු සමාගමක් වශයෙන් පාලනය වන බවත්ය. තම සමාගමේ 4500 ක පමණ කාර්ය මණ්ඩලයක් සිටින බවත් එයින් බහුතරය නිෂ්පාදන කාර්යයට සම්බන්ධව කටයුතු කරන බවත් ආයතනය රජය සතුවීමෙන් පසු ඒ ඒ රජයන්ගේ දේශපාලනික අවශ්‍යතාවය මත පාලන අධිකාරිය සකස් වන බවත් ඒ අනුව තීන්දු තීරණ ගැනීම රාජ්‍ය දෙපාර්තමේන්තුවක මෙන් චක්‍රලේඛ හා අණපනත්වලට අනුකූලව සිදුවීම මන්දගාමී බවත්ය. විශේෂයෙන් ආයතනය වෙනුවෙන් කාර්ය මණ්ඩල අනුමත

කර ගැනීමක් බඳවා ගැනීමේ සුදුසුකම් අනුමත කර ගැනීම ඉල්ලුම්පත් කැඳවීම සහ බඳවා ගැනීම උසස්වීම් ලබාදීම යනාදිය ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සභාපතිගේ මතය අනුව සිදුවන බවත් ය. එම නිසා පළමු වන පාර්ශ්වය ඉල්ලා සිටින පරිදි උසස්වීම් ලබාදීම වෙනුවෙන් නිවැරදිව චක්‍රලේඛ මත පදනම්ව උසස්වීම් පටිපාටියක් ක්‍රියාත්මක වන්නේ 2017 න් පසුව බවත් මේ වන විට විධිමත් පරිදි වසර පහෙන් පහට උසස්වීම් ලබාදීමේ පටිපාටියක් ක්‍රියාත්මක වන බවත් ඒ අනුව 2018.08.01 එස් 2 ශ්‍රේණියට උසස් කළ පළමුවන පාර්ශ්වකරු 2023.10.01 වන දින සිට එස් 1 ශ්‍රේණියට උසස්වීමක් ලබා දෙන බවත් ය.

1. ඉහත සියලු කරුණු හා ඊට අදාළ ලේඛන පරිශීලනයෙන් අනතුරුව මාහට හැඟී යන්නේ පළමුවන පාර්ශ්වකරු ක්ෂේත්‍ර නිලධාරියෙකු වන බැවින් කාර්යාල නිලධාරියෙකුට මෙන් සිය පෞද්ගලික ලිපි ගොනුව හරහා රාජකාරි ඉටු කර ගැනීමත් ඉහළ කළමණාකරන නිලධාරින් සමඟ සමීප සබඳතාවයක් ගොඩනගා ගනිමින් ශ්‍රේණි උසස්වීම් සඳහා නිර්දේශ කරවා ගැනීම පහසු කටයුත්තක් නොවන බවයි. ඒ බව තහවුරු වන්නේ පළමුවන පාර්ශ්වකරුගේ සාක්ෂියේ දී ගොනු කරන ලද ඒ - 2(ඒ) සහ ඒ - 2(බී) යන ලේඛන තම උසස්වීම් වෙනුවෙන් ආයතන ප්‍රධානීන් මඟින් ඉල්ලා සිටි ලිඛිත ලේඛන වුවත් එම ලේඛනවල ඡායා පිටපත් පළමුවන පාර්ශ්වකරු සතු වුවත් එම ලේඛන කිසිවක් ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුවේ දක්නට නොවීමයි. එම ලේඛන දෙකෙන්ම උසස්වීම් සඳහා 2015 දී ඔහු නිර්දේශ වී ඇත. නමුත් පෞද්ගලික ලේඛනයේ ඒවා නොමැතිවීම හේතුවෙන් එම අවස්ථාව ඔහුට අහිමි වී තිබේ.

2. එමෙන්ම මෙම අයාතනය රජය සතුවීමෙන් අනතුරුව සිය සේවකයින් සහ කාර්ය මණ්ඩලයේ සමස්ථ දත්ත ඇතුළත් කළමණාකරන තොරතුරු පද්ධතියක් (MIS එකක්) නොවීම කළමණාකාරිත්වයේ ප්‍රබල අඩුවක් ලෙස දකිමි. ඒ බව තහවුරු වන්නේ 2017 වර්ෂයේ අවස්ථා දෙකක දී උසස්වීම් සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවීමක් එම් අවස්ථා දෙකම එකම කාණ්ඩයට අයත් කාර්ය මණ්ඩලය සඳහා වීමත්, අනතුරුව 2019 වර්ෂයේ ද එම කාණ්ඩය සඳහාම උසස්වීම් සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවීමක් යන කාරණය තුළිනි. ආයතනය තුළ මනා කළමණාකරන තොරතුරු පද්ධතියක් තිබෙන්නේ නම් ඒ තුළින් සිය සේවකයාගේ පෞද්ගලික තොරතුරු මෙන්ම ඔහු සේවයට බැඳුන දිනය, සේවා කාලය, අදාළ ශ්‍රේණිය ඒ ඒ ශ්‍රේණියේ පලපුරුද්ද, සුවිශේෂී දක්ෂතාවයන් හා කුසලතාවයන්, ඔහු ලබා ඇති වැටුප් රහිත නිවාඩු යනාදී සියලු විස්තර ආයතනයේ මානව සම්පත් කළමණාකරන අංශයේ පවත්වාගෙන යාම ඉතා පහසු කටයුත්තක් වේ. ඒ තුළින් වරින්වර අභ්‍යන්තර උසස්වීම් සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ අවශ්‍යතාවයක් ඇති නොවන අතර ජ්‍යෙෂ්ඨතාවය සහ කුසලතාවය මත උසස්වීම් පිරිනැමීමේ හැකියාව ඇත. එයින් අදහස් වන්නේ මෙම සීනි සමාගමේ කාර්ය මණ්ඩලයේ බහුතරයක් අඩු අධ්‍යාපන සුදුසුකම් සහිත ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයක් වන අතර ඔවුන්ට ලබාදෙන ශ්‍රේණි උසස්වීම් නිසි වේලාවට හෝ නිසි ආකාරයට ලබාදෙනු ලබන්නේ නම් එය සේවක උත්ප්‍රේරණයක් වන බවයි. දෙවන පාර්ශ්වය ගොනු කර ඇති උසස්වීම් ලබාදීමට අදාළ දැන්වීම් 3 ට අනුව ශ්‍රේණි උසස්වීම් නොලබා වසර 10, වසර 7, වසර 5 (වග 3 ඒ, බී සහ සී) වශයෙන් එකම ශ්‍රේණියේ රැඳී සිටි කාලය ක්‍රම ක්‍රමයෙන් අඩු කිරීම තුළින් පැහැදිලි වන්නේ ඉහත දැක්වූ පරිදි නිසි කළමණාකරන තොරතුරු පද්ධතියක් අනුව කටයුතු නොකරන බවයි.

3. තව ද පළමුවන පාර්ශ්වකරු සහ සමකාලීනව සේවයට බැඳුනු වෙනත් සේවකයින් කිහිප දෙනෙකුට ශ්‍රේණි උසස්වීම් ලබා දී ඇත්තේ ඔවුන්ගේ කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය අනුව බවට දෙවන පාර්ශ්වය සිය සාක්ෂි මඟින් ඔප්පු කිරීමට උත්සාහ කළ ද එම සේවකයින්ගේ උසස්වීම් වලට අදාළව ලිඛිත ඉල්ලීම් දෙවන පාර්ශ්වකාර ආයතනයේ සභාපති වෙත ඉදිරිපත් කර ඇති අතර එම ලේඛනවල සඳහන් වන්නේ ඔවුන්ගේ කාර්යක්ෂමතාවය හෝ ඵලදායීතාවය අනුව උසස්වීම් ලබාදෙන නොව තමන් දැනට මුහුණ දී ඇති ආර්ථික දුෂ්කරතා හේතුවෙන් ඊට සහනයක් වශයෙන් උසස්වීම් ලබාදෙන ලෙසය. දෙවන පාර්ශ්වකාර ආයතනයේ ඉහළ කළමණාකාරිත්වය උසස්වීම් සඳහා අනුමැතිය ලබා දී ඇත්තේ එම දුක්ගැනවිල්ලට අදාළව මිස ඔවුන්ගේ කාර්යක්ෂමතාවය හෝ ඵලදායිතාවය හෝ සළකා බැලීමෙන් නොවන බව පැහැදිලි විය. ඒ අනුව පුද්ගල බද්ධව ශ්‍රේණි උසස්වීම් ලබා දී ඇති බවක් මැනවින් නිරීක්ෂණය වේ.

ඉහත සියලු කරුණු සළකා උද්ගත වී ඇති ආරාවුලේ පළමුවන පාර්ශ්වකරු සම්බන්ධව පහත පරිදි තීරණය ලබාදෙමි. දෙවන පාර්ශ්වකාර ලංකා සීනි පුද්ගලික සමාගම 2011 වසරේ රජය සතුවීමෙන් අනතුරුව නිසි පරිදි විධිමත් හා යාවත්කාලීන කළ කළමණාකරන තොරතුරු පද්ධතියක් තිබුණේ නම් වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබන වසර 5 න් 5 ට වූ උසස්වීම් පටිපාටිය ආරම්භයේ සිටම ක්‍රියාත්මක කළ හැකිව තිබුණි. පළමුවන පාර්ශවකරුට එස් 3 ශ්‍රේණියේ සිට එස් 2 ශ්‍රේණියට උසස්වීම් ලබාදීමට වසර 9 ක කාලයක් ගතවීමත් ඔහු හා සමානව තනතුරු හා ශ්‍රේණි දැරූ අයට ඊට වඩා අඩු කාලයකින් උසස්වීම් හා වෙනත් වරප්‍රසාද සහිතව උසස්වීම් ලබාදීමත් පිළිබඳව සළකා දැනට පාලන අධිකාරියේ ගෙන ඇති තීරණය පරිදි 2023.10.01 වන දිනට එස් 1 ශ්‍රේණියේ පිහිටුවන ලබන පළමුවන පාර්ශ්වකරුගේ උසස්වීම එදිනට ලබාදී එම උසස්වීම 2021.10.01 දින දක්වා වසර දෙකක් පෙරදාතම් කළ

යුතු බවට තීරණය කරමි. ඒ අනුව පළමු වන පාර්ශ්වකරුට 2021.10.01 දින සිට එස් 1 ශ්‍රේණියට හිමි මූලික වැටුප් හා දීමනා සියල්ලේ එකතුව වශයෙන් මසකට රු. 63,104.00 බැගින් ගෙවීම (මෙම වැටුපෙන් එස් 2 ශ්‍රේණියට අදාළව ගෙවූ වැටුප් හා දීමනා අඩු කළ යුතුවේ.) කළ යුතු බවටත් තීරණය කරමි. ඒ අනුව 2021.10.01 දින සිට පළමුවන පාර්ශ්වකරු එස් 1 ශ්‍රේණියට උසස්වීම් ලද අයෙකු සේ සැළකිය යුතු වේ. ඒ අනුව කම්කරු කොමසාරිස් ජනරාල්ගේ 2022.12.27 වන දින දරන අංක IR/COM/04/2020/112 ලිපියෙන් මා වෙත දක්වා ඇති මෙම කාර්මික ආරාවුල සම්බන්ධව නගා ඇති ප්‍රශ්නවලට පහත පරිදි පිළිතුරු ලබා දෙමි.

1. එස්. ඩී. නිහාල් රාජපක්ෂ මහතාට එස් 1 ශ්‍රේණියට උසස්වීම් ලබාදීමෙන් අසාධාරණයක් සිදුව තිබේද?

   *පිළිතුර:* ඔව්, එස් 3 ශ්‍රේණියේ සිට එස් 2 ශ්‍රේණිය ලබාදීමේ දී වසර 9 ක කාලයක් ගතව තිබීමත්, එම ශ්‍රේණියේම සිටි සෙසු අයට ලබාදී තිබූ සහන මොහුට ලබා නොදීමත්, එම කාලය තුළ වැටුප් රහිත නිවාඩු හෝ වෙනත් උසස්වීම් ලබා නොදීමට තරම් කරුණු කාරණා නොමැතිවීමත්, මත අසාධාරණයක් සිදුව ඇති බව තීරණය කරමි.

2. ඒ අනුව හිමි විය යුතු සහනය කුමක්ද?

   *පිළිතුර:* පාලන අධිකාරිය විසින් 2023.10.01 වන දිනට පළමුවන පාර්ශ්වකරු එස් 1 ශ්‍රේණියට උසස් කරනු ලබන්නේ නම් එලෙස උසස් කිරීමෙන් අනතුරුව එම උසස්වීම 2021.10.01 දින දක්වා වසර දෙකක් පෙරදාතම් කිරීමත් එදින සිට එස් 1 ශ්‍රේණියට හිමි සියලු දීමනා සහිතව මසකට රු. 63,104.00 ක් වන වැටුප (දැනටමත් ගෙවා ඇති එස් 2 ශ්‍රේණියට හිමි වැටුප අඩු කර ගැනීමෙන් අනතුරුව) ගෙවීම් කළ යුතු වේ.

3. කවරදා සිට ද?

   *පිළිතුර:* පළමුවන පාර්ශ්වකාර එස්. ඩී. නිහාල් රාජපක්ෂ මහතාට එස් 1 ශ්‍රේණි උසස්වීම 2021.10.01 වන දිනට සිට ක්‍රියාත්මක විය යුතු බව තීරණය කරමි. මෙම ප්‍රදානය ගැසට්ගත වීමෙන් මසක් ඇතුළත එම උසස්වීම හා හිඟ වැටුප් හා දීමනා ලබාදීමට කටයුතු කර ඒ බව මොණරාගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

   මෙම තීරණය හේතුකොට ගෙන පළමු පාර්ශ්වකරුට හිමි වෙනත් ව්‍යවස්ථාපිත දීමනා හෝ වෙනත් ලැබීම් වේ නම් ඒවා ලබා ගැනීමට මෙම තීරණය බාධාවක් නොවිය යුතු බවටත් තීරණය කරමි.

ඉහත ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත බව ප්‍රකාශ කරමි.

ඩබ්. ඒ. ජයවික්‍රම,<br>
බේරුම්කරු.

EOG 12 - 0027

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.